# සමුද්‍ර සම්පත් සංරක්ෂණය සහ දකුණු ආසියානු කලාපීය පරිසර සහයෝගීතාවය.

මහාචාර්ය සුකී ඒකරත්න

පෘථිවි තලයෙන් 75% ක තරම් වූ විශාල ප්‍රදේශයක් වසා පැතිරෙන මහා සමුද්‍රයන් ආශ්‍රිතව දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංවිධානයේ සමාජිකත්වය දරණ රටවල් බොහෝමයක් පිහිටා තිබේ. සාගරයන් ආශ්‍රිත දේශයන්හි ජනජීවිත කෙරෙහි එය බලපෑම් කරන්නාසේ ම, සාගරයන්ගෙන් වෙන්ව පවතින ජාතීන් හට ද ඉන් ඈත්වී සිටීම අසීරු කරුණක් වී ඇත. එය එතරම් වැදගත් හා විශේෂිත වූ සම්පතකි.

සමුද්‍රයෙහි සිදුවන නොයෙකුත් ක්‍රියා මාර්ග හා සන්තතීන් ජන ජිවිත හා ජීවන රටාවන් කෙරෙහි විශේෂයෙන් ම කාලගුණික හා දේශගුණික විපර්යාස හරහා බලපෑම් කරන බව දැන් පැහැදිලි වී ඇත. සමුද්‍රයෙහි විශාලත්වය සලකන විට එවන් බලපෑම් ඇතැයි විශ්වාස කිරීම අසීරු කරුණක් නොවේ. වර්ෂාපතනයන් පිළිබඳව මෑතකදී කෙරුණු විද්‍යාත්මක පර්යේෂණවලට අනුව අප අවට වාතයේ ගුණාත්මක භාවය ද සමුද්‍ර සන්තතීන්ගේ බලපෑම් ලබන බව හෙළි වී තිබේ. දකුණු ආසියානු කලාපයේ, ජෛව විවිධත්වයෙන් බහුල වූ සමුද්‍ර සම්පතක් වන කොරල් පරයන්ගේ ප්‍රකෘති වර්ණයන් විනාශවීමට හා මිය යාමට හේතු වූ El-nino (එල් නිනෝ) සංසිද්ධියෙන් ම පමණක් සමස්ථ ලෝකය හෝ කලාපය හෝ කෙරෙහිම බලපවත්නා සන්සිද්ධීන් පිළිබඳව කටයුතු කිරීමට ජාතීන්ට තනි වශයෙන් නැගී සිටීමට අසීරු බව හොඳින් පැහැදිලි විය.

මෑත යුගයේදී දියුණු වූ මාර්ග හා ප්‍රවාහන පහසුකම් නිසා සමුද්‍ර සම්පත හා ඒ ආශ්‍රිත පාරිසරික සන්තතීන් පිළිබඳ අවබෝධයක්, ඒ වෙත ගොස් එය අත්විඳීම මගින් වැඩි දියුණු කර ගැනීමට ජනතාවට අවස්ථාව සැලසී ඇත. මෙසේ අප ජීවිතයන් කෙරෙහි සාගරයන්ගේ වැදගත්කම පිළිබඳ අවබෝධය වැඩිවීම, ඒ පිළිබඳව ජනමාධ්‍ය තුළින් ලබාදෙනු ලබන ප්‍රසිද්ධිය හා වගකීම් සහිත ප්‍රවෘත්ති පළකිරීම මගින් නිරූපණය වේ. විශේෂයෙන් ම මෙහිලා විශාල සේවයක් රූපවාහිනිය හා ප්‍රවෘත්ති පත්‍ර මගින් ඉටු කෙරේ. කොළඹ තටාංගනයේ මෑතකදී සිදු වූ තෙල් කාන්දු වීම ඊට කදිම නිදසුනකි.

භෞතික පරිසරය මෙන් නොව, සාගර පරිසරයට පහසුවෙන් අවතීර්ණවීමේ සහ දැන ගැනීමේ හැකියාවන් අවම වීම නිසා මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ලබාදෙන ප්‍රසිද්ධිය හා අවබෝධය ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටු කරයි.

සමුද්‍රය හා ඒ පරිසර පද්ධති, කැළි කසල හෙළීම, අධි කෘමිනාශක හා රසායනික පොහොර භාවිතය වැනි මිනිසුන්ගේ නොමනා ක්‍රියාවන් නිසා අඛණ්ඩව දූෂණය වීමේ හා විනාශවීමේ තර්ජනයට මුහුණ දී තිබේ. මෙවන් ක්‍රියාකාරකම් නිසා සිදුවන සමුද්‍ර දූෂණය, සීමාවන් පසුකරමින් සමුද්‍ර ජීවීන්ට හා සන්තතීන්ට බලපෑම් කරන අවස්ථාවන් එළඹෙන විට සමුද්‍ර සංරක්ෂණයේ අවශ්‍යතාවය වඩ වඩාත් කැපී පෙනීමට පටන් ගනී. එහෙයින් විනාශය බරපතලවීමට ප්‍රථම, අහිතකර බලපෑම් හඳුනා ගැනීමට හැකිවන පරිදි සමුද්‍ර පරිසරය දීර්ඝ කාලීන පරීක්ෂණයකට ලක් කිරීමත්, මිනිසාගේ සමුද්‍ර ආශ්‍රිත ක්‍රියාකාරකම් මනාව කළමනාකරණය කිරීමත් ඉතා වැදගත්වේ.

සමුද්‍ර සංරක්ෂණය හා කළමනාකරණයේදී ද සමුද්‍ර පරිසරයන් වර්තමානයේදී මෙන්ම අනාගතයේදී ද උපරිම ප්‍රතිඵල ලබා ගැනීමටත්, සියලු සමාජ සමූහයන්ට ප්‍රයෝජනවත් වන පරිදි කටයුතු සැලසුම් කිරීමත් අපේක්ෂා කෙරේ. සමුද්‍රයේ "සැමට පොදු" ස්වභාවය නිසාත්, භෞමික පරිසරයේදී මෙන් පහසු වෙන්කිරීම් කළ නොහැකි නිසාත්, මෙය තනි රටකට කළ හැකි කර්තව්‍යයන් නොවේ. ඒ නිසා අඛණ්ඩ ලෙස, දිගුකාලීනව ජෛවීය මෙන්ම අජෛවීය සම්පත් පරිභෝජන ක්‍රම ගොඩ නැංවීමට හා ක්‍රියාත්මක කිරීමට අප කලාපයේ සියලුම දේශයන් එක්විය යුතුව ඇත.

## සමාජ ආශ්‍රිත සම්පත් කළමනාකරණය

මෙවැනි ගැටලු සහිත අවස්ථා යෝජනා වී ඇති ප්‍රායෝගිකාත්මක ක්‍රමයකි. සමාජ ආශ්‍රිත සම්පත් කළමනාකරණය අප කලාපීය ජාතීන් එවැන්නක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අත්දැකීම් වලින් පොහොසත්ය. මේ පිළිබඳව බොහෝ සෙයින් ප්‍රයෝජනයට ගත හැකි කරුණු පසුගිය දිනෙක නව දිල්ලියේ දී පැවැති සම්මන්ත්‍රණයකදී ප්‍රකාශයට පත් විය.

අප රටවල සමුද්‍රාශ්‍රිත සමාජ කොට්ඨාශ තම ජීවිකාව කරගෙන යාමේදී සමුද්‍ර සම්පත නන් අයුරින් උපයෝගී කර ගනියි. මේ අතර, ආහාර හා අපනයනය සඳහා මසුන් ලබා ගැනීම, ඖෂධ සහ රසායනික ද්‍රව්‍ය නිපදවීමට අමුද්‍රව්‍ය ලබාගැනීම වැනි සම්පත් උපුටා නොගන්නා ක්‍රියාවන් ද වේ. මුළු දකුණු ආසියානු කලාපය තුළම ක්‍රියාත්මක වන පරිදි, මෙවන් සමුද්‍ර සම්පත් විනාශ නොවන ක්‍රියාවන් දියුණු කිරීම හා හඳුන්වාදීම තුලින් සමුද්‍රාශ්‍රිත සමාජයන්හි පුද්ගලයින්ගේ ජීවනෝපාය මාර්ගයන් වැසී නොයන පරිදි සමුද්‍ර සම්පත රැකගැනීමට ක්‍රියා කලයුතු කාලය දැන් එළඹ ඇත. තෙල් හා කුණු කසල ඇතුළු සාගර දූෂණයන් අධ්‍යයනය කිරීම හා ඒ පිළිබඳව ක්‍රියා කිරීම, සමුද්‍රය හා ඒ ආශ්‍රිත පරිසර පද්ධති වෙනස් කිරීම හා විනාශ කිරීම අවම කිරීම, ආහාරමය හා විසිතුරු මසුන්, බෙල්ලන් හා අනෙකුත් අපෘෂ්ඨ වංශික සතුන් අනවසරයෙන් හා පමණ ඉක්මවා ඇල්ලීම වැළැක්වීම පිළිබඳව ක්‍රියා කිරීම සහ සමුද්‍රය හා ආශ්‍රිත පරිසර පුනරුත්ථාපනය හා වඩා සාරවත් කිරීම කලාපීය වශයෙන් අප අවධානය යොමු කළයුතු කරුණු වේ.

භෞමික පරිසරයේ මෙන් නොව සමුද්‍ර පරිසරයේ ජීවී සම්පත් අතර සතුන් ප්‍රමුඛස්ථානයක් ගන්නා අතර බහුලද වේ. එහෙයින් අපගේ පර්යේෂණ කටයුතු ආශ්‍රයයන් සාගර සන්තතීන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම ඉතාම වැදගත් වේ. අප කිසිදිනෙක අපේක්ෂා

නොකරන පරිදි ඉතා ගැඹුරු මුහුදේ සරු ජීවී සම්පත් හමුවීම මෙය වඩාත් තහවුරු කරයි. සංවිධානයක් වශයෙන් එක්ව පර්යේෂණ කටයුතු හා අඛණ්ඩ අධ්‍යයන කටයුතු ශක්තිමත් කිරීම තුලින් කලාපීය සමුද්‍ර සම්පත් සංරක්ෂණය කිරීමේ අරමුණ ඉටුකර ගතහැකි වනු ඇත. මේ සඳහා අප සතු යටිතල පහසුකම් දැනට ක්‍රියාත්මක වන එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩ පිළිවෙලෙහි දකුණු ආසියානු සමුද්‍ර කලාපීය වැඩ සටහන, ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකු මගින් ආධාර ලබන වැඩසටහන් ආධාරයෙන් ශක්තිමත් හා වර්ධනය කරගත යුතු වේ. මේ සම්බන්ධයෙන් දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංවිධානය සාකච්ඡා කර ඇති නමුත්, හරියාකාර මගපෙන්වීමක් යටතේ නැවත ක්‍රියාත්මක කිරීම අවශ්‍ය වේ. අපගේ අවශ්‍යතාවයන් කාලයත් සමග නැවත තක්සේරු කිරීමත්, අදාළ ජාතික අවශ්‍යතාවයක් වී ඇත. ප්‍රාදේශිය හා ජාතික වශයෙන් සැලසුම් සකස් කිරීමටත්, ඇති දුෂ්කරතා මැඩ පැවැත්වීම සඳහා සමාජයීය, මූල්‍යමය, යටිතල සහ ආයතනික ධාරිතාවයන් වර්ධනය කිරීම අවශ්‍යයෙන්ම කළයුතුව ඇත.

මේ සඳහා අගය කළයුතු කාර්යභාරයක් මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍යයන් තුළින් සිදුකෙරෙන අතර, කලාපීය වශයෙන් පොදු අදහස් මත පිහිටා කලාපීය සමුද්‍ර සංරක්ෂණ ක්‍රියා මාර්ග ප්‍රායෝගික ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන විද්‍යාත්මක පසුබිමක් වර්ධනය කිරීම වැදගත් වේ.

## පරිසර මිහිර

ඈත එපිට අනන්තයට
පාර කියන සුදු සේද වළාකුළු
සිහින් සරින් ගීත ගයන
සිහිල් ගඟුල් පළිඟු දිය ඇලි

නෙතට සුවය සතුට ගෙනෙන
නිල කඳුවැටි
උසට නැගී අතු පතර බෙදුණු
හරිත වන සුළි

වන පහසේ ඉපිද වැඩෙන
කුරුළු සත්ව අඩ හැරේ
මල් රේණු සොයා ඇදෙන
බිගුන් දසත හැඩ කෙරේ

වෙරළ වැළඳ පෙමින්
බැඳුණු සයුරු රළ රැලි
ඒ අතරේ රඟන
රන් මත්ස්‍ය සැණකෙලි

මවුකිර බිඳකින් - හිරු රැස් පොදකින්
ජීවය ලද අප - උතුම් මිනිස් කුලේ
සුන්දරත්වයේ රස මිහිර විඳ හදවතින්
එදසුන් සොඳුරු සුරකිමු නුවණැසින්

සන්ධ්‍යා විජයබණ්ඩාර